සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# තෙවන වාර පරීක්ෂණය 2020

10 ශ්‍රේණිය **ව්‍යවසායකත්ව අධ්‍යයනය - I** කාලය පැය 01 යි.

නම/ විභාග අංකයඃ

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. ව්‍යාපාරික දෘෂ්ටි කෝණයෙන් ව්‍යවසායකත්වය අර්ථ දක්වන ආකාරය වන්නේ,
(1) මිනිස් චින්තනය හා බැඳුණු මනෝභාවයකි
(2) සිතන, තර්ක කරන හා ක්‍රියා කරන ආකාරයකි
(3) අනාගතය වෙනස් කිරීමට පොළඹවන්නා වූ පුද්ගලයින්ගේ මානසික තත්වයකි
(4) ව්‍යාපාර අදහස් හඳුනා ගෙන ඒවා යම් ප්‍රායෝගික ව්‍යාපාර කටයුත්තක් බවට පත් කිරීමට ඇති හැකියාවයි

02. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා භාවිතයට ගනු ලබන සම්පත් පොදුවේ හඳුන්වන්නේ,
(1) නිෂ්පාදන සාධක ලෙසය (2) ප්‍රාග්ධන සාධක ලෙසය
(3) භෞතික සාධක ලෙසය (4) ස්වභාවික සාධක ලෙසය

03. ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව,
(1) නවෝත්පාදනය ලෙස හඳුන්වයි
(2) නම්‍යශීලීත්වය ලෙස හඳුන්වයි
(3) නිර්මාණශීලිත්වය ලෙස හඳුන්වයි
(4) පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනා ගැනීම ලෙස හඳුන්වයි.

04. විවිධත්වය ග්‍රහණය කර ගැනීම යනු,
(1) නවෝත්පාදනය සිදුවන ආකාරයයි
(2) නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධකයකි
(3) නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රයකි
(4) නිර්මාණශීලීත්වය වර්ධනය කර ගත හැකි ක්‍රමයකි.

05. නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු ම ස්වභාවික සම්පත් හඳුන්වන්නේ,
(1) ඉඩම් ලෙසය (2) භූමිය ලෙසය (3) අමුද්‍රව්‍ය ලෙසය (4) වනාන්තර ලෙසය

06. "පෙනිසිලින්" සොයා ගැනීම අයත් නවෝත්පාදනය සඳහා පදනම් වන මූලාශ්‍රය වන්නේ,
(1) අනපේක්ෂිත සිදු වීමකටය (2) ක්‍රියාවලි අවශ්‍යතාවයකටය
(3) වෙළඳපල වෙනස් වීමකටය (4) දැනුම් පදනම් කරගත් සංකල්පයකටය

07. වෙළඳ පොළට පිවිසීමට වෙර දරමින් සිටින දර්ශනගේ අදහස වන්නේ වෙනස් දෙයක් කරමින් වෙළඳ පොළට පිවිසීමයි. මෙය ඔහු තුළ ඇති,
(1) නම්‍යශීලීත්වයයි (2) අනාගත දැක්මයි
(3) නිර්මාණශීලිත්වයයි (4) අවස්ථා හඳුනාගැනීමයි

08. ව්‍යවසායකයින් අසාර්ථකත්වය සලකන්නේ,
(1) වැරදීමක් ලෙසය (2) අවස්ථාවක් ලෙසය
(3) අත්දැකීමක් ලෙසය (4) ව්‍යාපාරයට එල්ල වූ තර්ජනයක් ලෙසය

09. මිනිසුන්ගේ සෑම වුවමනාවක් ම බිහි වී ඇත්තේ,

(1) ආශාවන් මතය (2) අවශ්‍යතා මතය (3) මූල්‍ය ශක්තිය මතය (4) සමාජ තත්ත්වය මතය

10. ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර ඇති සමාන කමක් නොවන්නේ,

(1) ගනුදෙනුවල නිරත වීම (2) අවදානමට මුහුණ දීම

(3) සම්පත් භාවිත කිරීම (4) තරඟය කැමැත්තෙන් සොයා යාම

11. සීනි කර්මාන්ත ශාලාවක සේවයේ නිරත වන සේවිකාවක් විසින් දියවැඩියා රෝගීන් සඳහා සුදුසු වන සීනි වර්ගයක් සොයා ගන්නා ලදී. ඇය,

(1) සමාජයීය ව්‍යවසායකාවකි (2) ව්‍යාපාර ව්‍යවසායිකාවකි

(3) අභ්‍යන්තර ව්‍යවසායිකාවකි (4) නිර්මාණශීලී ව්‍යවසායිකාවකි

12. මිනිසුන් ව්‍යවසායකත්ව කාර්යයේ නිරත වීම තුළින්, සුළු පිරිසක් අතර බෙදී යන ආදායම බහුතරයක් අතර බෙදීයාම හඳුන් වන්නේ,

(1) ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම ලෙසය

(2) ස්වයංපෝෂිත බව ලෙසය

(3) දිළිඳු බව අඩු වීම ලෙසය

(4) මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස්වීම ලෙසය

13. ව්‍යවසායකයින් නායකත්ව භූමිකාවේ කටයුතු කිරීමේ දී ඉටු කරන කාර්යයකි.

(1) අවදානම් දැරීම (2) අවශ්‍ය සම්පත් සැපයීම

(3) වැදගත් තීරණ ගැනීම (4) සේවකයින් පෙළඹවීම

14. ව්‍යාපාරයට ගෙනා යන්ත්‍රයක් නිවැරදි ව ස්ථාන ගත කිරීම, ක්‍රියාත්මක කිරීම, අලුත්වැඩියා කිරීම යනාදී කාර්යයන් කිරීමට ව්‍යවසායකයාට ඇති හැකියාව

(1) මානව කුසලතා ලෙස හඳුන්වයි (2) තාක්ෂණික කුසලතා ලෙස හඳුන්වයි

(3) උපදේශන කුසලතා ලෙස හඳුන්වයි (4) සංකල්පනාත්මක කුසලතා ලෙස හඳුන්වයි

15. කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථක කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ගයක් නොවන්නේ,

(1) ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම

(2) ප්‍රවීනයන්ගේ උපදෙස් ලබා ගැනීම

(3) අයහපත් මානව සම්බන්ධතා පවත්වා ගෙන යාම

(4) නිවැරදි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම

16. ව්‍යාපාරයට බලපෑම් ඇති කරන පරිසර සාධක අතරින් ව්‍යාපාරයට ඉතා සමීපව ම බලපෑම් එල්ල කරන බලවේග ක්‍රියාත්මක වන පරිසරය,

(1) ආසන්න පරිසරය ලෙස හඳුන්වයි (2) ස්වාභාවික පරිසරය ලෙස හඳුන්වයි

(3) ප්‍රජා පරිසරය ලෙස හඳුන්වයි (4) සමාජ හා සංස්කෘතික පරිසරය ලෙස හඳුන්වයි

17. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශයක් වන ප්‍රාථමික අංශයට අයත් ව්‍යාපාර ක්ෂේත්‍රයකි,

(1) නිමැවුම් කර්මාන්තය (2) පතල් හා කැණීම් කර්මාන්තය

(3) ඉදිකිරීම් කර්මාන්තය (4) මැණික් ඔප දැමීමේ කර්මාන්තය

18. ව්‍යාපාර පවතින්නේ,

(1) නිෂ්පාදනය පදනම් කර ගෙනය

(2) භාණ්ඩ හා සේවා පදනම් කර ගෙනය

(3) මිනිසුන්ගේ අවශ්‍යතා හා වුවමනා පදනම් කර ගෙනය

(4) ආකර්ශනීය ලාභයක් ඉපයීමේ අරමුණ පදනම් කර ගෙනය

19. දැව උළුවහු වෙනුවට ප්ලාස්ටික උළුවහු නිෂ්පාදනය කිරීම අයත් වන්නේ,

(1) ආදේශ කිරීමකටය (2) එකතු කිරීමකටය

(3) යලි සකස් කිරීමකටය (4) සම්බන්ධ කිරීමකටය

20. මැකිය හැකි තීන්ත සහිත කාබන් පෑනක් හඳුන්වා දීම

    (1) පවතින වෙළඳසැලකට නව භාණ්ඩයක් හඳුන්වා දීමකි

    (2) නව වෙළඳපළකට නව භාණ්ඩයක් හඳුන්වා දීමකි

    (3) නව වෙළඳපලකට පවතින භාණ්ඩයක් හඳුන්වා දීමකි

    (4) පවතින වෙළඳපලකට පවතින භාණ්ඩයක් හඳුන්වා දීමකි

21. "අදහස් ශත දහයකට දුසිමක් ගත හැකිය" යනු ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති කියමනකි. මෙහි අදහස නම්,

    (1) ව්‍යාපාර අදහස් අල්ප වීම (2) ව්‍යාපාර අදහස් සුළභ වීම

    (3) ව්‍යාපාර අදහස් සීමා සහිත වීම (4) ව්‍යාපාර අදහස් සොයා ගැනිමට අපහසු වීම

22. ඉදිරිපත් කරන භාණ්ඩයකට හෝ සේවාවකට ප්‍රමාණවත් අලෙවියක් පැවතීම යනු,

    (1) ව්‍යාපාර අවස්ථාවක පැවතිය යුතු ලක්ෂණයකි

    (2) හොඳ වෙළඳපලක පැවතිය යුතු ලක්ෂණයකි

    (3) ව්‍යාපාර අදහසක පැවතිය යුතු ලක්ෂණයකි

    (4) හොඳ නිෂ්පාදනයක පැවතිය යුතු ලක්ෂණයකි

23. ක්‍රීඩකයින්ට ක්‍රීඩා උපකරණ, සැපයීමේ නිරත ආයතන විසින්ම ක්‍රීඩකයින්ට අවශ්‍ය ඖෂධ වර්ග සහ ආහාර වර්ග සැපයීම අයත් ව්‍යාපාර අදහස් පහළ වන මූලාශ්‍රය වන්නේ,

    (1) සැපයුම්කරුවන් ඇසුරින් (2) ගැනුම්කරුවන් ඇසුරින්

    (3) තරඟකරුවන් ඇසුරින් (4) සමාජයීය පරිසරය ඇසුරින්

24. යෝග්‍ය ව්‍යාපාර අවස්ථාවක් තෝරා ගැනීම සඳහා අනුගමනය කරන පියවර අතරින් තුන්වන පියවර වන්නේ,

    (1) තරඟකාරිත්ව විශ්ලේෂණය (2) සාර්ව විශ්ලේෂණය

    (3) ශදුඅත විශ්ලේෂණය (4) සූක්ෂම විශ්ලේෂණය

25. නව සොයා ගැනීමක් වෙනුවෙන් රජයෙන් ලබා දෙන සහතිකයේ ආයු කාලය

    (1) වසර 15 කි. (2) වසර 20 කි (3) වසර 22 කි (4) වසර 25 කි.

26. ව්‍යාපාරයක් සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව පිළිබඳ ව සොයා බලන්නේ,

    (1) ශදුඅත විශ්ලේෂණයේ දීය (2) සූක්ෂම විශ්ලේෂණයේ දීය

    (3) සාර්ව විශ්ලේෂණයේ දී ය (4) ස්වභාවික පරිසර විශ්ලේෂණයේ දී ය

27. ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් පැවතීම සහ මූල්‍ය ස්ථාවරත්වයක් පැවතීම යනු,

    (1) බාහිර පරිසරයේ ඇති අවස්ථාවකි (2) ආසන්න පරිසරයේ ඇති අවස්ථාවකි

    (3) සූක්ෂම පරිසරයේ ඇති ශක්තියකි (4) අභ්‍යන්තර පරිසරයේ ඇති ශක්තියකි

28. පවතින සංකල්පයක හෝ සාධකවල නව එකතු කිරීමක් හෝ මිශ්‍රණයක් භාවිතා කර නව නිපැයුමක් බිහි කිරීම හඳුන්වන්නේ,

    (1) දිගුවක් ලෙස (2) සංකලනයක් ලෙස

    (3) අනුකරණය කිරීමක් ලෙස (4) නව සොයා ගැනීමක් ලෙස

29. පරියේෂණ හා අත්හදා බැලීම් තුළින් නව භාණ්ඩයක් හෝ සේවාවක් බිහි කිරීම,

    (1) වෙළඳපොල වෙනස්වීමක් නිසා සිදුවන්නකි

    (2) ක්‍රියාවලි අවශ්‍යතාවයක් නිසා සිදුවන්නකි

    (3) දැනුම පදනම් කරගත් සංකල්පයක් නිසා සිදු වන්නකි

    (4) ප්‍රජා පරිසරයේ හා ජන ජීවිතයේ වෙනස් වීමක් නිසා සිදු වන්නකි

30. ව්‍යවසායකයකුට මුහුණ දීමට සිදුවන අවදානමට ප්‍රධානම හේතුව,

(1) අලාභයයි (2) අලසකමයි (3) අකාර්යක්‍ෂමතාවයයි (4) අවිනිශ්චිතතාවයයි

31. ව්‍යවසායකයින් විසින් සිය ව්‍යාපාර සඳහා ඇති ශක්තීන් හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණය කරනු ලබන්නේ,

(1) ආසන්න පරිසරයයි (2) සූක්‍ෂම පරිසරයයි

(3) බාහිර පරිසරයයි (4) අභ්‍යන්තර පරිසරයයි

32. "ව්‍යවසායකයින් තමාගේම ස්වාමියා වීමට කැමැත්තක් දක්වයි" මෙයින් ගම්‍ය වන ව්‍යවසායකත්ව ගුණාංගය

(1) ස්වාධීනත්වයයි (2) කැපවීමයි

(3) අධිෂ්ඨානශීලීත්වයයි (4) ආත්ම විශ්වාසයයි

33. පරිසරයේ සිදු වන වෙනස්වීම් හඳුනාගෙන එම වෙනස්වීම් වලට අනුව වෙනස් වීමට ව්‍යවසායකයකුට ඇති හැකියාව

(1) නම්‍යශීලීත්වය ලෙස හඳුන්වයි (2) අවදානම් භාර ගැනීම ලෙස හඳුන්වයි

(3) නවෝත්පාදනීය බව ලෙස හඳුන්වයි (4) නිර්මාණශීලීත්වය ලෙස හඳුන්වයි

34. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ලීම සඳහා බිහි කරනු ලබන සේවාවක දැකිය හැකි ලක්‍ෂණයකි,

(1) ස්පෘෂ්‍ය බව (2) අදෘෂ්‍යමාන බව

(3) ගබඩා කළ හැකි බව (4) සපයන්නාගෙන් වෙන් කළ හැකි බව

35. තොග හා සිල්ලර වෙළඳාම අයත් වන ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශය වන්නේ,

(1) සේවා අංශයයි (2) ප්‍රාථමික අංශයයි

(3) තෘතියික අංශයයි (4) ද්විතියික අංශයයි

36. ව්‍යාපාර කටයුතු වල නිරත වන සියලුම පුද්ගලයින් හඳුන් වන්නේ,

(1) සේවකයින් ලෙස ය (2) කළමනාකරුවන් ලෙසය

(3) කම්කරුවන් ලෙසය (4) මානව සම්පත් ලෙසය

37. තම ව්‍යාපාරයේ නිෂ්පාදිත තරඟකරුවන්ගේ නිෂ්පාදිත වලින් වෙනස් කිරීමට ගන්නා උත්සාහය,

(1) නිෂ්පාදිත ප්‍රභේදනයයි (2) නිෂ්පාදන ප්‍රභේදනයයි

(3) තරඟකාරීත්ව ප්‍රභේදනයයි (4) වෙළඳපොළ ප්‍රභේදනයයි

38. මේදය හා සීනි රහිත කිරිපිටි නිෂ්පාදනය කිරීම අයත් වන්නේ කුමන නිෂ්පාදන නව්‍යකරණ ක්‍රමයට ද?

(1) යළි සකස් කිරීමකට ය (2) නව සොයා ගැනීමකට ය

(3) ඉවත් කිරීමකටය (4) සම්බන්ධ කිරීමකට ය

39. ව්‍යාපාරයක ආසන්න පරිසර බලවේගයන් වන්නේ,

(1) අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්

(2) අයිතිකරුවන්, ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්

(3) සැපයුම්කරුවන්, තරඟකරුවන්, ගනුදෙනුකරුවන්

(4) සේවකයන්, කළමනාකරුවන්, සැපයුම්කරුවන්

40. අන්තර්ජාතික වෙළඳාම අයත්වන ව්‍යාපාර පරිසර බලවේගය වන්නේ,

(1) ආසන්න පරිසරය (2) ගෝලීය පරිසරය

(3) ව්‍යාපාර බාහිර පරිසරය (4) සමාජ හා සංස්කෘතික පරිසරය

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **ව්‍යවසායකත්ව අධ්‍යයනය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

---

(01) පිළිගත් ආයතනයක කෘෂි විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා ධාරියකු වන හසිත ව්‍යාපාරයක් ආරම්භ කිරීම පිළිබඳව සිහින දකිමින් සිටි නිර්මාණශීලී පුද්ගලයෙකි. ඔහු එම සිහිනය සැබෑ කර ගැනීම සඳහා වෙළඳපොල අධ්‍යයනයක් සිදු කර ඇත. එහි දී මිනිසුන් සෞඛ්‍ය සම්පන්න ආහාර පිළිබඳව දැඩි අවදානයකින් පසු වන බවත්, බොහෝ පිරිසක් කාබනික පොහොර යොදා වගා කරන ලද එළවළු හා පළතුරු ආහාරයට ගැනීමට වැඩි කැමැත්තක් දක්වන බවත් අනාවරණය කරගෙන ඇත. නමුත් ඔවුන්ගේ එම අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් කාබනික පොහොර යොදා වගා කරන ලද එළවළු හා පළතුරු වෙළඳපොලේ නොමැති බව ද අනාවරණය කරගෙන ඇත. එමෙන්ම කෘෂි කර්මාන්තයේ නිරත ගොවීන් කාබනික පොහොර යොදා වගා කිරීමෙන් ඉහළ අස්වැන්නක් ක්ෂණිකව ලබා ගැනීමට නොහැකි වීම නිසා රසායනික පොහොර හා කෘමිනාශක භාවිතයට වැඩි නැඹුරුවක් දක්වන බව ද අනාවරණය කර ගෙන ඇත.

හසිත විසින් සිදු කරන ලද වෙළඳපොල අධ්‍යයනයෙන් ලබා ගත් තොරතුරු පදනම් කරගෙන ඉතා ඉක්මනින් / අඩු කාලයකින් ඉහළ අස්වැන්නක් ලබා දිය හැකි දියර කාබනික පොහොර සහ ශාක සාරයෙන් සැකසූ කෘමිනාශක හා වල් නාශක දියර වර්ගයක් වෙළඳපොලට හඳුන්වාදී ඇත. එමෙන්ම ඔහුගේ නිෂ්පාදිත භාවිතයෙන් වගා කරන ලද අක්කර දෙකක් මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කර ඇත.

හසිතගේ ව්‍යාපාරයේ නිෂ්පාදිත සඳහා ඉහළ ඉල්ලුමක් පවතින අතර එය සම්පූර්ණයෙන් සපුරාලීමට නම් ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමට සිදුවේ. මේ සඳහා හසිත අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇති අතර උපයන ලාභයෙන් කොටසක් ප්‍රදේශයේ පවතින පාසල්වල ආර්ථික අපහසුතා ඇති දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රධානයටත්, ප්‍රදේශයේ ඇති වැඩිහිටි නිවාස දෙකක් සතියකට වතාවක් බැගින් විෂබීජහරණය කර භාර දීමටත් පියවර ගෙන ඇත.

ඉහත සඳහන් සිද්ධිය ඇසුරින් i සිට x දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. හසිත මහතා තුළ දැකිය හැකි ව්‍යවසායකත්ව ගුණාංග 4 ක් සඳහන් කරන්න.

ii. හසිත මහතාට ව්‍යාපාර අදහස පහළ වූ මූලාශ්‍රය සඳහන් කරන්න.

iii. මෙම ව්‍යාපාරයේ නවෝත්පාදනය සිදු වන ආකාරය ලියන්න.

iv. හසිත මහතාගේ ව්‍යාපාරයෙන් බිහි කරනු ලබන නිෂ්පාදිත 2 ක් ලියන්න.

v. මෙම ව්‍යාපාරිකයා වෙළඳ පොලට ප්‍රවේශ වන ක්‍රමය සඳහන් කරන්න.

vi. හසිත මහතා කුමන වර්ගයේ ව්‍යවසායකයෙක් ද?

vii. සමාජ සුභසාධනය සඳහා හසිත මහතා දායක වන ආකාර 2 ක් ලියන්න.

viii. හසිත මහතා තුළ ඇති ශක්තීන් 2 ක් ලියන්න.

ix. හසිත මහතාගේ ව්‍යාපාරයේ ඉලක්ක පාරිභෝගිකයින් කවරෙක් දැයි සඳහන් කරන්න.

x. SCAMPER ආකෘතියට අනුව හසිත මහතාගේ නිෂ්පාදිත අයත් වන්නේ කුමන නව්‍යකරණයට ද?

(ලකුණු 02 × 10 = 20)

(02) i. නිෂ්පාදන සාධකයක් වන භූමිය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

ii. ප්‍රාග්ධනය නමැති නිෂ්පාදන සාධකය සඳහා උදාහරණ 4 ක් ලියන්න.

iii. ව්‍යවසායකයකුට තම නිර්මාණශීලීත්වය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියා මාර්ග 4 ක් සඳහන් කරන්න.

iv. ව්‍යවසායකයකු ව්‍යවසායකත්ව කාර්යයේ නිරත වීමෙන් හිමි වන ප්‍රධාන ප්‍රතිලාභ 2 සඳහන් කරන්න.

v. භාණ්ඩ හා සේවා අතර ඇති වෙනස්කම් 2 ක් ලියන්න. (ලකුණු 02 × 05 = 10)

03. (i) නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

(ii) ව්‍යාපාරයක පැවතිය හැකි ගති ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(iii) වර්තමානයේ බිහිවීඇති සමාජයීය ව්‍යවසායකයින් සඳහා උදාහරණ 2 ක් ලියන්න.

(iv) පරිමාණය අනුව ව්‍යාපාර වර්ග කර, එයින් බොහෝ රටවල සුළභව පවතින ව්‍යාපාර වර්ගය සඳහන් කරන්න.

(v) ව්‍යවසායකයකුගේ නිර්මාණශීලිත්වය අගය කළ හැකි ක්‍රම 2 ක් සඳහන් කරන්න.

(ල. 2 × 5 = 10)

04. (i) ව්‍යවසායකත්ව සංකල්පය ඔබට හැගෙන පරිදි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) ව්‍යවසායකයකුට සමාජ සුභසාධනය සඳහා දායක විය හැකි ක්‍රම 4 ක් ලියන්න.

(iii) කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(iv) ව්‍යවසායකත්වය හා කුඩා පරිමාණ ව්‍යාපාර අතර පවතින සම්බන්ධතාවය පෙන්වා දීම සඳහා අදාළ වන කරුණු 2 ක් සඳහන් කරන්න.

(v) කුඩා පරිමාණ ව්‍යාපාරවල දැකිය හැකි ශක්තීන් 2 ක් සඳහන් කරන්න.

(ල. 2 × 5 = 10)

05. (i) ව්‍යාපාර පරිසරය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) ව්‍යාපාර පරිසර ප්‍රවණතා 4 ක් සඳහන් කරන්න.

(iii) වර්තමාන ව්‍යාපාර පරිසරය තුළ ඇතිවී තිබෙන වෙනස්කම් අවබෝධකර ගැනීමෙන් ව්‍යාපාරිකයෙකුට අත්කර ගත හැකි ප්‍රයෝජන 2 ක් ලියන්න.

(iv) අතීත ව්‍යාපාර පරිසරය හා නූතන ව්‍යාපාර පරිසරය අතර ඇති වෙනස්කම් 2 ක් සඳහන් කරන්න.

(v) ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී ගත යුතු වැදගත් තීරණ 4 ක් සඳහන් කරන්න.

(ල. 2 × 5 = 10)

06. (i) ඉලක්කගත පාරිභෝගිකයා යනු කවරෙක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) නව ව්‍යවසායකයකුට ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ප්‍රාග්ධනය සම්පාදනය කරගත හැකි ක්‍රම 4 ක් සඳහන් කරන්න.

(iii) පහත සඳහන් ව්‍යාපාර ස්ථානගත කිරීමට සුදුසු ම ස්ථානය සඳහන් කරන්න.

| | |
|---|---|
| (අ) සිල්ලර වෙළඳසැලක් | (ආ) රෙදි සාප්පුවක් |
| (ඉ) තොග අලෙවිසැලක් | (ඊ) උත්සව ශාලාවක් |

(iv) මෑත කාලීනව බිහි වී ඇති නවෝත්පාදන සඳහා උදාහරණ 2 ක් සඳහන් කරන්න.

(v) ව්‍යාපාර අභ්‍යන්තර පරිසර සාධකයක් වන සේවකයින් තුළ පැවතිය හැකි දුර්වලතා 2 ක් ලියන්න.

(ල. 2 × 5 = 10)

07. (i) ව්‍යාපාර අදහසක් යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) ව්‍යවසායකයකුට ව්‍යාපාර අදහස් පහළ විය හැකි මූලාශ්‍ර 4 ක් සඳහන් කරන්න.

(iii) හොඳ ව්‍යාපාර අවස්ථාවක දැකිය හැකි ලක්ෂණ 4 ක් ලියන්න.

(iv) සාර්ව විශ්ලේෂණයේ දී සලකා බලන සාධක 2 ක් ලියන්න.

(v) ව්‍යාපාර අදහස් හා ව්‍යාපාර අවස්ථා අතර ඇති වෙනස්කම් 2 ක් ලියන්න.



(ල. 2 × 5 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(4) | 2 -(1) | 3 -(3) | 4 -(4) | 5 -(2) | 6 -(1) | 7 -(2) | 8 -(3) | 9 -(2) | 10 -(4) |
| 11-(3) | 12-(1) | 13-(4) | 14-(2) | 15-(3) | 16-(1) | 17-(2) | 18-(3) | 19-(1) | 20-(1) |
| 21-(2) | 22-(1) | 23-(1) | 24-(3) | 25-(2) | 26-(2) | 27-(4) | 28-(2) | 29-(3) | 30-(4) |
| 31-(4) | 32-(1) | 33-(1) | 34-(2) | 35-(3) | 36-(4) | 37-(1) | 38-(1) | 39-(3) | 40-(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. • දක්මක් සහිත වීම • අවදානම් දැරීම • නම්‍යශිලීත්වය • නවෝත්පාදශිය බව
• නිර්මාණශිලීත්වය • කැපවීම (කරුණු 4 කට ල. 1/2 බැගින් ල. 02 යි)

ii. • වෙළඳපළ සමීක්ෂණ තුලින්/ වෙළෙඳපළ අධ්‍යයනය තුළින්
(නිවැරදි පිළිතුරට ල. 02 යි)

iii. • දිගුවක් (නිවැරදි පිළිතුරට ල. 02 යි)

iv. • දියර කාබනික පොහොර • ශාක සාරයෙන් නිපද වූ වල් නාශක දියර
• ශාක සාරයෙන් නිපද වූ කෘමිනාශක දියර
(එක් කරුණකට ල. 01 බැගින් කරුණු 02ක ල. 02යි)

v. පවතින වෙළඳපොලකට නව භාණ්ඩයක් ඉදිරිපත් කිරීම මගින් (නිවැරදි පිළිතුරට ල. 02 යි)

vi. ව්‍යාපාර ව්‍යවසායකයෙකි

vii. • ආර්ථික අපහසුතා ඇති පාසල් සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම
• ප්‍රදේශයේ ඇති වැඩිහිටි නිවාස විෂබීජ හරණය කිරීම
(නිවැරදි එක් කරුණකට ල. 01 බැගින් කරුණු දෙකකට ල. 02 යි)

viii. • ව්‍යාපාර කටයුත්ත පිළිබඳව දැනුමක් අවබෝධයක් පැවතීම
• මූල්‍ය ශක්තියක් පැවතීම (නිවැරදි පිළිතුරකට ල. එක බැගින් පිළිතුරු 02 කට ල. 02 යි)

ix. • ගොවියන් (නිවැරදි පිළිතුරට ල. 02 යි)

x. • ආදේශ කිරීමකටය (නිවැරදි පිළිතුරට ල. 02 යි)

(02) i. නිෂ්පාදනය සඳහා අවශ්‍ය කරන ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සියලු ම ස්වභාවික සම්පත් භූමිය ලෙස හැඳින් වේ. (නිවැරදි පිළිතුරට ල. 02 යි)

(ii) • යන්ත්‍ර සූත්‍ර • ගොඩනැගිලි
• උපකරණ • රථවාහන (ගැලපෙන කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 කට ල. 02 යි)

(iii) ⋆ විවිධත්වය ග්‍රහණය කර ගැනීම මගින් ⋆ අසාර්ථකත්වය ඉවසීම මගින්
⋆ කුතුහලය දිරිමත් කිරීම මගින් ⋆ ගැටලු අභියෝග ලෙස දැකීම මගින්
⋆ නිර්මාණශිලි පුහුණු අවස්ථාවලට සහභාගි වීම මගින්
⋆ නිර්මාණශිලිත්වය අගය කිරීම මගින්
⋆ නිර්මාණාත්මක හැසිරීම ආදර්ශනය කිරීම මගින්
(නිවැරදි එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු හතරකට ල. 02 යි)

(iv) • ව්‍යවසායකයාට හිමිවන ප්‍රතිලාභ • දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභ
(එක් කරුණකට ල. 01 බැගින් කරුණු 02 කට ල. 02 යි)

(v)

| භාණ්ඩ | සේවා |
|---|---|
| • ස්පෘශ්‍ය වේ / භෞතික පැවැත්මක් ඇත | • අස්පෘශ්‍ය වේ / භෞතික පැවැත්මක් නැත |
| • ගබඩා කළ හැකිය | • ගබඩා කළ නොහැකිය |
| • සමජාතීය බව ආරක්ෂා කළ හැකිය | • සමජාතීය බව ආරක්ෂා කළ නොහැකිය |
| • සපයන්නාගෙන් වෙන් කළ හැකිය | • සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය |

(නිවැරදිව ගලපන ලද එක් කරුණකට ල. 1 බැගින්
කරුණු 02 කට ල. 02 යි)

03. (i) ගැටලු හා අවස්ථා දෙස බලනා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයා ගැනීමට ඇති හැකියාව නිර්මාණශිලිත්වය වන අතර නිර්මාණශීලී අදහස් හෙවත් හැකියාවන් ප්‍රායෝගික කටයුත්තක් / නිෂ්පාදිතයක් බවට පත් කිරීම නවෝත්පාදනය ලෙස හඳුන්වයි.

(අදහස නිවැරදිව පැහැදිලි කෙරෙන පිළිතුරට ල. 02 යි)

(ii) • ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනු වල යෙදවීම • ගනුදෙනු අඛණ්ඩව සිදු වීම
• අරමුණක් පැවතීම • අවදානමක් පැවතීම
• මූල්‍යමය ගනුදෙනු සැලකිල්ලට ගැනීම • ආර්ථික කටයුත්තක නිරත වීම
(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 4 කට ල. 02 යි)

(iii) ගැළපෙන පිළිතුරු දෙකකට ල. 02 යි

(iv) • සුළු පරිමාණ • මධ්‍ය පරිමාණ
• මහා පරිමාණ • සුළු පරිමාණ ව්‍යාපාර වේ
(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 4 කට ල. 02 යි)

(v) ⋆ මූල්‍යමය ත්‍යාග ලබා දීම මගින් ⋆ උපකාර ලබා දීම මගින්
⋆ සම්මාන ලබා දීම මගින් ⋆ වටිනාකම අගය කිරීම මගින්
(ගැළපෙන කරුණකට ල. 1 බැගින් කරුණු 2 කට ල. 02 යි)

04. (i) පරිසරයේ ඇති ව්‍යාපාර අවස්ථා හඳුනා ගනිමින් අවදානම් දරමින් නිර්මාණශීලීත්වය තුළින් නවෝත්පාදනය බිහි කිරීමේ ක්‍රියාවලිය ව්‍යවසායකත්වයයි. (ගැලපෙන පිළිතුරකට ල. 02 යි)

(ii) ගැළපෙන පිළිතුරු එකකට ල. 1/2 බැගින් පිළිතුරු 04 කට ල. 02 යි

(iii) • කුඩා ප්‍රාග්ධනයක් යොදවා තිබීම • සේවක සංඛ්‍යාව අඩු වීම
• ව්‍යාපාරය තනි අයිතිකරුවකු සතු වීම • තීරණ ගැනීම පහසු වීම
• ආරම්භ කිරීම පහසු වීම • නීතිමය බලපෑම් අඩු වීම
(එක් කරුණකට ල.1/2 බැගින් කරුණු04 කට ල. 02 යි)

(iv) ⋆ බොහෝ මහා පරිමාණ ව්‍යාපාර වල ආරම්භක අවස්ථාව කුඩා පරිමාණ ව්‍යාපාරයක් වීම
⋆ වෙළඳපල හිඩැස් හඳුනා ගෙන ව්‍යාපාර සඳහා පිවිසිය හැකි වීම
⋆ නවෝත්පාදන හඳුන්වා දීමට පහසු වීම
(ගැළපෙන කරුණකට ල. 1 බැගින් කරුණු 2 කට ල. 02 යි)

(v) • සීමිත සම්පත් ප්‍රමාණයකින් ආරම්භ කළ හැකි වීම
• ගතික පරිසරයට ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය හැකි විම
• පවුලේ සාමාජිකයින්ගේ සහාය ව්‍යාපාරය සඳහා ලබාගත හැකි වීම
• සේවකයින් වැඩි වරප්‍රසාද බලාපොරොත්තු නොවීම
• සේවකයින් බඳවා ගැනීම හා පුහුණුව පහසු වීම
• රජයෙන් විශේෂ දිරි ගැන්වීම් ලැබීම
• දේශීය තාක්ෂණය භාවිත කළ හැකි වීම
(එක් කරුණකට ල.1 බැගින් කරුණු02 කට ල. 02 යි)

05. (i) ව්‍යාපාර වල ක්‍රියාකාරිත්වයට ව්‍යාපාර අභ්‍යන්තරයෙන් මෙන්ම බාහිර ව ධනාත්මකව හා ඍණාත්මකව බලපෑම් ඇති කරන සාධක හා බලවේග සියල්ල ව්‍යාපාර පරිසරය ලෙස හැඳින්වේ. (නිවැරදි පිළිතුරට ල. 02 යි)

(ii) • ගෝලීයකරණය • පරිසර හිතකාමී බලශක්ති ජනනය
• නැනෝ තාක්ෂණය භාවිතය • සෞඛ්‍ය ආරක්ෂිත ආහාර නිෂ්පාදනය
(ගැළපෙන කරුණකට ල. 1/2 බැගින් කරුණු 4 කට ල. 02 යි)

(iii) • ව්‍යාපාරය සතු ශක්තීන් හඳුනා ගත හැකි වීම
• ව්‍යාපාරය තුළ ඇති දුර්වලතා හඳුනා ගත හැකි වීම
• ව්‍යාපාරයට ඇති අවස්ථා හඳුනා ගත හැකි වීම
• ව්‍යාපාරයට මුහුණ දීමට සිදුවිය හැකි තර්ජන හඳුනා ගත හැකි විම
• පරිසර වෙනස්වීම් වලට ගැලපෙන පරිදි සැලසුම් සැකසිය හැකි වීම
(ගැළපෙන කරුණකට 2කට ල. 02 යි)

(iv)

| අතීත ව්‍යාපාර පරිසරය | නූතන ව්‍යාපාර පරිසරය |
|---|---|
| • අවශ්‍යතා හා වුවමනා සරල වීම<br>• තරගකාරිත්වය අඩුවීම<br>• ව්‍යාපාරිකයෝ බලවත් වීම<br>• ලාභය ප්‍රධාන අරමුණු වීම | • අවශ්‍යතා හා වුවමනා සංකීර්ණ වීම<br>• තරගකාරිත්වය වැඩිවීම<br>• පාරිභෝගිකයෝ බලවත් වීම<br>• ලාභය පමණක් නොව සමාජ වගකීම් පිළිබඳව ද අවධානය යොමු කිරීම |

(වෙනස්කම් එකකට ල. 1 බැගින් වෙනස්කම් දෙකක් සඳහා ල. 02 යි)

06. (i) ව්‍යාපාරිකයා විසින් ඉදිරිපත් කරන නිෂ්පාදිතය ඉදිරිපත් කරන්නේ කුමන පාරිභෝගික භණ්ඩායම අරමුණු කරගෙන යන වග (නිවැරදි පිළිතුරට ල. 02 යි)

(ii)
- ස්වකීය ඉතුරුම් මගින්
- නෑදෑ හිත මිතුරන්ගෙන් ඉල්ලා ගැනීම
- බැංකු ණය ලබා ගැනීම මගින්
- ගණුදෙනු කරුවන්ගෙන් අත්තිකාරම් ලබා ගැනීම මගින්
- තමා සතු වත්කම් විකිණීම මගින් (කරුණු 1 කට ල. 1/2 බැගින් කරුණු 4 කට ල. 02 යි)

(iii) (අ) ජනතාව නිතර ගැවසෙන ස්ථානයක්
(ආ) ජනාකීර්ණ ස්ථානයක්
(ඉ) වාහන නැවතීමට ඉඩ පහසුකම් ඇති ජන ශූන්‍ය ස්ථානයක්
(ඊ) නිස්කලන්ක ඉඩ පහසුකම් ඇති තැනක් (එක් පිළිතුරකට ල 1/2 බැගින් පිළිතුරු 4 ල. 2 යි)

(iv) ගැළපෙන පිළිතුරු දෙකකට ල. 02 යි.

(v)
- පුහුණුව අඩුකම
- ආයතනයට ලැදි නොවීම
- සේවක ගැටලු පැවතීම (ගැලපෙන එක් කරුණකට ල. 1 බැගින් කරුණු 2 කට ල. 2 යි)

07. (i) පරිසරයේ ඇති ගැටලුවකට විසඳුමක් ලෙස පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලන වාණිජමය වටිනාකමක් ඇති සිතුවිල්ලකි. (නිවැරදි පිළිතුරකට ල. 02 යි)

(ii)
- ජන මාධ්‍ය මගින්
- විනෝදාංශ හා ලැදියා තුළින්
- පුද්ගල දක්ෂතා හා පළපුරුද්ද තුළින්
- වෙළඳපල සමීක්ෂණ තුළින්
- පාරිභෝගික ප්‍රතිචාර තුළින්
- නිර්මාණශීලි චින්තන හැකියා තුළින්
- සැපයුම්කරුවන් ඇසුරින්
- තරඟකාරීත්වය අධ්‍යයනය තුළින්
- අධ්‍යාපන පාඨමාලා තුළින්
- ප්‍රදර්ශන හා අත්දැකීම් තුළින්

(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 කට ල. 02)

(iii)
- ඉල්ලුමක් පැවතීම
- අවශ්‍ය සම්පත් සපයාගත හැකි වීම
- නීතිරීති වලට අනුකූල වීම
- තරඟකාරීත්වයට මුහුණ දිය හැකි වීම
- ආකර්ෂණීය ඉපයුමක් පැවතීම

(එක් කරුණකට ල. 1/2 බැගින් කරුණු 04 කට ල. 02)

(iv)
- ⋆ නිෂ්පාදිත අලෙවි කර ගැනීමේ හැකියාව
- ⋆ අවශ්‍ය සම්පත් පවතී ද යන වග
- ⋆ ව්‍යවසායකයාගේ හැකියා හා දක්ෂතා වලට ගැළපේද යන වග
- ⋆ උදවු උපකාර ලබා ගැනීමට හැකියාව පවතී ද යන වග
- ⋆ අවශ්‍ය අරමුදල් සපයා ගැනීමේ හැකියාව
- ⋆ නීතිමය බාධා පවතී ද යන වග (එක් කරුණකට ල. 1 බැගින් කරුණු 2 කට ල. 02)

(v)

| ව්‍යාපාර අදහස් | ව්‍යාපාර අවස්ථා |
|---|---|
| • ව්‍යාපාර අදහස් සුලභය | • ව්‍යාපාර අවස්ථා සුලභ නොවේ |
| • ව්‍යාපාර අදහස් විවෘතය | • ව්‍යාපාර අවස්ථා විවෘත නොවේ |
| • ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය නොහැකිය | • ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකිය |

(නිවැරදිව ගලපන ලද පිළිතුරු 2කට ල. 02යි)